2020.02.03. අරුණ පිටුව 2

# 2021 ජන සංගණනය වෙනස්ම අයුරකින්

කුමාර එන්. අස්මඩල

2021 වසරේදී පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකාවේ 15 වැනි ජන හා නිවාස සංගණනය සඳහා රුපියල් මිලියන 2800 ක් වැය වෙතැයි ගණන් බලා තිබේ. එම සංගණනයට අදාළ සිතියම් සකස් කිරීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර, මේ දිනවල සිදුවන්නේ ඒ ඒ ප්‍රදේශ අනුව පවතින ලේඛන හා දත්ත විශ්ලේෂණයයි.

2021 වසරේ සිදු කිරීමට නියමිත ජන හා නිවාස සංගණනය මේ දක්වා සිදුකළ සංගණනවලට වඩා වෙනස් වේ. ඒ මෙවර තාක්ෂණික ක්‍රියාවලියක් මඟින් දත්ත හා තොරතුරු එක් රැස් කිරීමට කටයුතු සම්පාදනය කර ඇති නිසාය. මේ වන විටත් ටැබ්ලට් වර්ගයේ පරිගණක යොදා ගනිමින් ඒ සඳහා අවශ්‍ය මූලික සැලසුම් සකස් කරමින් සිටින බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඉන්දු බණ්ඩාර පැවැසුවාය. සංගණනයේ සමස්ථ වියදම රුපියල් මිලියන 2800 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, සමස්ථ සංගණන ක්‍රියාවලිය සඳහා 45000 ක බළකායක් යොදා ගැනීමට නියමිතය. රාජ්‍ය සේවකයන්, බාහිර සංවිධාන, ස්වේඡා ආයතන, විශ්වවිද්‍යාල ඇතුළු සමස්ථයම ඒකාරාශී කර ගනිමින් 2021 ජන හා නිවාස සංගණනය වඩාත් සාර්ථකව සිදුකිරීම එම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

2011 වසරේ සිදුකළ ජන හා නිවාස සංගණනයේ තොරතුරුවලට අනුව මෙරට ජනගහණය දෙකෝටි දෙලක්ෂ හැත්තෑ හත්දහස් පන්සිය අනූ හතක් (20,277,597) ක් ලෙස ගණනය කර තිබේ. එහිදී සමස්ථ ජනගහණ වර්ධන අනුපාතය සියයට 0.7ක් ලෙස ගණනය කර තිබිණි.